**දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල - 2015**

---

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 9(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මතය

---

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල්

ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් රු.1,256,732 ක අතිරික්තයක් නිරීක්ෂණය වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.285,389 ක ඌණතාවයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,542,121 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.1,500,000 කින් වැඩිවීම එම අතිරික්තය වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

---------------

(අ) 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත අනුව,

* දෘශ්‍යාබාධිතයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම,
* සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ට ස්වයං රැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ගෝපදේශකත්වය සැපයීම,
* ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීම,
* දෘශ්‍යාබාධිතයන්ගේ සුභ සාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හා ඔවුන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම සහ
* සමාන අයිතිවාසිකම් සහ සමාන අවස්ථා ලබාගැනීමෙන් දෘශ්‍යාබාධිත තැනැත්තන් වළක්වාලන තත්ත්වයන් නැති කිරීමට ක්‍රියාකිරීම අරමුදලේ ප්‍රමුඛ පරමාර්ථ විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුල දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ ඉහත පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා රු.7,000,000 ක ප්‍රතිපාදන සලස්වා තිබුණි. මෙහිදී යථෝක්ත පරමාර්ථ වලින් පරමාර්ථ 04 ක්‍රියාත්මක කිරීම සඳහා රු.6,050,000 ක් ප්‍රතිපාදන යොදවා තිබූ අතර ඉන් රු.4,722,117 ක් පමණක් වියදම් කර තිබුණි.

මේ සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ සිසුන් 250 දෙනෙකු සඳහා අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු වලට ආධාර කිරීමට රු.2,125,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද,සිසුන් 165 දෙනෙකුට පමණක් ආධාර ලබාදී තිබුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව එය සියයට 15 ක අඩුවීමකි.

(ii) සංශෝධිත ක්‍රියාකාරී සැළැස්ම අනුව පුනරුත්ථාපන වැඩසටහන යටතේ ආයතන 03 ක අන්ධ පුද්ගලයින් 70 ක් වෙනුවෙන් පුනරුත්ථාපන ආධාර ලබාදීමට සැළසුම් කර තිබුණද, ආධාර ලබාදී තිබුණේ 16 දෙනෙකුට පමණි. එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 42 ක පහත වැටීමක් බව පෙන්නුම් කෙරිණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ පුද්ගලයන් 04 දෙනෙකු සඳහා වෘත්තිය පුහුණුව ලබාදීමට ප්‍රතිපාදන වෙන්කර තිබුණද, පුහුණු ලාභීන් දෙදෙනෙකු සඳහා පමණක් වෘත්තීය පුහුණුව ලබාදී තිබුණි. ඒ හේතුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදන මුදලින් සියයට 50 ක් උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණි.

(iv) දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීම සහ දෘශ්‍යාබාධිතයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම යන පරමාර්ථ 02 ක ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන වෙන්කර ගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 2 වගන්තිය ප්‍රකාර අරමුදලේ කළමනාකරණය හා පරිපාලනය කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරී තිබුණද, මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද කිසිදු කළමනාකරණ මණ්ඩල රැස්වීමකට සහභාගිවී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද කළමනාකරණ මණ්ඩල රැස්වීම්වලදී දෘශ්‍යාබාධිත අය සහ සියළුම ආබාධිත පුද්ගල සංඛ්‍යාව පිළිබඳව දත්ත ඒකකයක් පවත්වාගෙන යාම හා දෘශ්‍යාබාධිතයින් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක් සකස්කිරීමට යෝජනා සම්මතකර ගෙන තිබුණු නමුත් එම කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

## 5.1 ක්‍රියාකාරී සැළැස්ම

-------------------

අරමුදල සඳහා වූ ක්‍රියාකාරී සැළැස්ම නැවත සංශෝධනය කර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට සංශෝධිත ක්‍රියාකාරී සැළැස්මක් සකස්කර තිබුණද සැළැස්මේ ඉලක්ක සපුරා ගැනීමට හැකිවී නොතිබුණි.

## 5.2 අයවැය පාලනය

-----------------

අයවැය ලේඛනයේ වියදම් සමඟ තත්‍ය වියදම් සැසඳීමේදී සියයට 17 සිට සියයට 86 ක දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.